සියලුම හිමිකම්ඇවිරිණි/All Right Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Southern Provincial Department of Education

**අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 13 ශ්‍රේණිය**
**තෙවන වාර පරීක්ෂණය 2019 ජූලි**
கல்விப் பொதுத் தராதர(உயர்தரப்)பரீட்சை ஜூலை தரம் 13 மூன்றாம் தவணைப் பரீட்சை
General Certificate of Education(Adv.Level) Grade 13 Third Term Test 2019 July

| | | |
|---|---|---|
| **භූගෝල විද්‍යාව - II**<br>Geography - II | 22 S II | **කාලය පැය තුනයි**<br>03 hours |

**සැලකිය යුතුයි**
එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්වත්** තෝරාගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න

## I කොටස භෞතික භූගෝල විද්‍යාව

01.(i) දේශගුණය පාලනය කරන සාධක **දෙකක්** නම් කරන්න (ලකුණු 02)

(ii) ඔබ ඉහත නම් කළ සාධක දේශගුණය පාලනය කිරීම සඳහා දායක වන ආකාරය රූප සටහන් අධාර කර ගනිමින් පැහැදිළි කරන්න (ලකුණු 06)

(iii)නිවර්තන කලාපය තුළ පිහිටීම හා අන්තර් නිවර්තන අභිසරණ කලාපය තුළ පිහිටීම ශ්‍රී ලංකාවේ දේශගුණය තීරණය කිරීමෙහිලා තීරණාත්මක බලපෑමක් ඇති කරයි. විමසන්න (ලකුණු 06)

(iv)P,Q,R ලෙස දක්වා ඇත්තේ පිළිවෙළින් ලෝකයේ පීඩන තීර කිහිපයකි. ඒවා නිවැරදිව නම් කර, ඒවා එක එකක් පිළිබඳ කෙටි විස්තර සපයන්න (ලකුණු 06)




02.(i)ආතතීය චලන හේතුකොටගෙන නිර්මාණය වන භූ රූප **දෙකක්** නම් කරන්න (ලකුණු 02)

(ii) යමකම ක්‍රියාවලිය හේතුකොටගෙන නිර්මාණය වන පහත දී ඇති භූ රූප, රූප සටහන් ආධාර කර ගනිමින් පැහැදිළි කරන්න

1.යමහල් ජේනුව 2.පාකොලිත 3.ලාවා සානුව (ලකුණු 06)

(iii) ලෝකයේ කාන්තාර ප්‍රදේශවල සිදුවන ඛාදන ක්‍රියාවලීන් **තුන** විස්තර කරන්න (ලකුණු 06)

(iv) කාන්තාර ප්‍රදේශවල සිදුවන පරිවහන ක්‍රියාවලීන් **දෙකක්** නම් කරන්න.එලෙස පරිවහනය වන ද්‍රව්‍ය නිධිසාධනය වීම හේතුකොටගෙන නිර්මාණය වන භූ රූප **දෙකක්** රූප සටහන් ආධාර කර ගනිමින් විස්තර කරන්න (ලකුණු 06)

03.(i)ලෝකයේ තුන්ද්‍රා දේශගුණය ව්‍යාප්තව පවතින ප්‍රදේශ **දෙක** සඳහන් කරන්න (ලකුණු 02)

(ii) ටයිගා වනාන්තර බියෝමයෙහි සුවිශේෂී ලක්ෂණ පහත ශීර්ශ යටතේ විස්තර කරන්න (ලකුණු 06)

1.ව්‍යාප්තිය 2.දේශගුණය 3.වෘක්ෂලතා




(iii) යාබද සිතියමෙහි දක්වෙන්නේ ශ්‍රී ලංකාවේ වෘක්ෂලතා කලාපයන්ය.එහි 3 සහ 4 යන අංක වලින් දක්වෙන වෘක්ෂලතා කලාප නිවැරදිව පිළිවෙළින් නම් කරන්න

අංක 2න් දක්වෙන ප්‍රදේශයේ ව්‍යාප්තව ඇති වෘක්ෂලතා කලාපය පිළිබඳව පහත මාතෘකා යටතේ විස්තර කරන්න

1.දේශගුණය 2.වෘක්ෂලතාවල ස්වභාවය (ලකුණු 06)

(iv) ශ්‍රී ලංකාවේ පරිසර පද්ධති සංරක්ෂණය සම්බන්ධයෙන් ගෙන ඇති නීතිමය ක්‍රියාමාර්ග **තුනක්** පිළිබඳව විස්තර කරන්න (ලකුණු 06)

04.(i) ධ්‍රැව ප්‍රදේශවල සහ භූ තැටි ආශ්‍රිතව බහුලව සිදුවන උපද්‍රව **එක බැගින්** පිළිවෙළින් නම් කරන්න (ලකුණු 02)

(ii) නායයෑම් උපද්‍රව හේතුවෙන් ඇතිවිය හැකි අහිතකර පාරිසරික බලපෑම් කරුණු **තුනක්** මගින් විමසන්න (ලකුණු 06)

(ii) නියග උපද්‍රවයක් ආපදා තත්වයක් දක්වා වර්ධනය වීම පාලනය කිරිම සඳහා ගතහැකි ක්‍රියා මාර්ග **තුනක්** සාකච්ඡා කරන්න (ලකුණු 06)

(iv)ශ්‍රී ලංකාවේ ඉදිරියේ ඇතිවිය හැකි කුමන හෝ ආපදා තත්වයකට මුහුණ දීම සඳහා ආපදා කළමණාකරණය සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියා මාර්ග **තුනක්** සාකච්ඡා කරන්න (ලකුණු 06)

## II කොටස මානුෂ භූගෝල විද්‍යාව

05.




(i) A සහ B ලෙස නම් කොට ඇති ලෝක ජන සංඛ්‍යා වර්ධන අවධීන් පිළිවෙළින් නම් කරන්න (ලකුණු 02)

(ii) B ලෙස නම් කොට ඇති වර්ධන අවධිය තුළ ජන සංඛ්‍යාව ඝාතීය ලෙස වර්ධනය වීම කෙරෙහි බල පෑ හේතු **තුනක්** පරීක්ෂා කරන්න (ලකුණු 06)

(iii)ලෝකයේ අනාගත ජන සංඛ්‍යා වර්ධන ප්‍රවණතා මහාද්වීපික සහ ප්‍රදේශීය වශයෙන් වෙනස්වන ආකාරය පැහැදිළි කරන්න (ලකුණු 06)

(iv)ජන සංඛ්‍යාව මානව සම්පතක් බවට පරිවර්තනය කිරීමෙහිලා ශ්‍රී ලංකා රජය ගෙන ඇති ක්‍රියා මාර්ග **තුනක්** සාකච්ඡා කරන්න (ලකුණු 06)

06(i) ලෝකයේ ඉහළ නාගරීකරණ මට්ටමක් පවතින කලාප **දෙකක්** නම් කරන්න (ලකුණු 02)

(ii)තුන්වන ලෝකයේ රටවල ඉහළ නාගරික ජන සංඛ්‍යාවක් ඇතිවීම කෙරෙහි බලපාන සාධක **තුනක්** විස්තර කරන්න (ලකුණු 06)

(iii)පහත දක්වා ඇත්තේ ලෝකයේ අඩු දියුණු රටවල අගනුවර ආශ්‍රිතව නාගරීකරණය හේතුවෙන් මතු වී තිබෙන ගැටලු කිහිපයකි.ඒවායේ ස්වභාවය පිළිබඳ විමසීමක් කරන්න

1.දරිද්‍රතාව 2.පහසුකම් කළමණාකරණය 3.සමාජ විරෝධී ක්‍රියා (ලකුණු 06)

(iv)තුන්වන ලෝකයේ රටවල නාගරීකරණ ගැටලු විසඳීමට ගෙන ඇති ක්‍රියාමාර්ග තවදුරටත් අසාර්ථකවීම කෙරෙහි බලපා ඇති සාධක **තුනක්** විමසන්න (ලකුණු 06)

07(i)සංචාරක කර්මාන්තයේ භෞතික සහ මානව ජන්‍ය පදනම කෙරෙහි බලපාන සාධක **එක** බැගින් පිළිවෙළින් සඳහන් කරන්න (ලකුණු 02)

(ii)ශ්‍රී ලංකාවේ හඳුනාගතහැකි සංචරණයේ ප්‍රභේද **තුනක්** උදාහරණ සහිතව විස්තර කරන්න (ලකුණු 06)

(iii)ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය පහත දක්වා ඇති ක්ෂේත්‍ර කෙරෙහි කවර බලපෑමක් ඇති කරයි ද යන්න විමසන්න

1.සමාජයීය හා සංස්කෘතිය 2.පාරිසරික 3.ආර්ථික (ලකුණු 06)

(iv)වර්තමානයේ පසු බෑමකට ලක්ව ඇති ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය යළි නගා සිටුවීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග **තුනක්** සාකච්ඡා කරන්න (ලකුණු 06)

08(i)ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට අනුව ගෝලීයකරණ ක්‍රියාවලියෙහි මූලික අංග **දෙකක්** නම් කරන්න (ලකුණු 02)

(ii)සංවර්ධනය වෙමින් පවතින රටවල ජාතික ආර්ථිකය නගා සිටුවීම සඳහා ගෝලීයකරණ ක්‍රියාවලියට බද්ධවීම තුළින් ඇතිවන ප්‍රතිවිපාක **තුනක්** පිළිබඳ විමසීමක් කරන්න (ලකුණු 06)

(iii)වර්තමාන ගෝලීයකරණ ක්‍රියාවලිය තුළ මානව සංචලනය වඩා වේගයෙන් සිදු වේ.එයට බල පා ඇති හේතු **තුනක්** පැහැදිළි කරන්න (ලකුණු 06)

(iv)ගෝලීයකරණ ක්‍රියාවලිය තුළ වේගවත්ව සිදුවන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දියුණුවේ අයහපත් බලපෑමක් ලෙස ගෝලීය ත්‍රස්තවාදය ශක්තිමත් වන ආකාරය පිළිබඳව කරුණු **තුනක්** මගින් විමසීමක් කරන්න (ලකුණු 06)